# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 7 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 7 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

ක්‍රිස්තියානි ධර්මය

7 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016
ජාතික අධ්‍යාපන ආයතනය
ISBN

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය.

### අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය**
: ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

: ගරු එස්. අන්ද්‍රයාස් ඒ ප්‍රනාන්දු පියතුමා නි.ම.නි.
සහකාර කතිකාචාර්ය
ආගම් දෙපාර්තමේන්තුව

**උපදේශක මණ්ඩලය:**

අතිගරු ඩිලෝරාජ් කනගසබේ රදගුරුතුමා
ලංකා සභාව, කොළඹ දියෝකීසිය.

අතිගරු ශාන්තා ෆ්‍රැන්සිස් රදගුරුතුමා.
ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය.

අතිගරු ආචාර්ය ඩැනියල් එස්. ත්‍යාගරාජා රදගුරුතුමා.
දකුණු ඉන්දියානු සභාව.

ගෞ. ආචාර්ය ඒ. ඩබ්. ජෙබනේසන් දේවගැතිතුමා.
මහනායකතුමා, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව.

ගෞ. ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා.
සංගමාධිපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

ගෞ. චාර්ලි ජැන්ස් දේවගැතිතුමා.
සභාපතිතුමා, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව.

ගෞ. සමන් පෙරේරා දේවගැතිතුමා.
ප්‍රෙස්බිටීරියන් සභාව.

කොමිෂනර් මැල්කම් ඉඳුරුවගේ.
ප්‍රාදේශීය මූලිකතුමා, ගැළවීමේ හමුදාව.

ගෞ. ඩබ්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා.
මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.

ගෞ. හේෂාන් ද සිල්වා දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

එම්. සභාරංජන් මහත්මිය.
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය.

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.

ගෞ. විලියම් විජේකෝන් දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

**ලේඛක මණ්ඩලය** : ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.
දේවධර්මවේදී, දිව්‍ය ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය)

එල්. නිලන්ති දීපා ද සිල්වා මිය.
බප/පිළි/මෙතොදිස්ත උසස් විදුහල - මොරටුව.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය), පුහුණු ගුරු (ක්‍රිස්තියානි ධර්මය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය.
ශා. තෝමස් විදුහල - ගල්කිස්ස.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය, ක්‍රිස්තු ධර්මය, සිංහල)
අධ්‍යාපනපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

අරුණි ඉන්දිකා පෙරේරා ජයතුංග මිය.
බිෂොප් විදුහල, කොළඹ - 3.
දේව ධර්මවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. රේණුකා දමයන්ති මිය.
කු/ මාවතගම මධ්‍ය මහ විද්‍යාලය - කුරුණෑගල.
ශාස්ත්‍රවේදී උපාධි, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. පී. සෙල්වනිදි පෙරේරා මිය.
වෙස්ලි විදුහල, කොළඹ - 8.
විශ්‍රාමික ගුරු උපදේශක (ක්‍රිස්තියානි ධර්මය), පුහුණු ගුරු (විද්‍යාව)

ඩී. ස්ටෙලා දර්ශනී මෙනවිය.
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.
දේවධර්මවේදී.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ක්‍රිස්තියානි ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබාගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය තුළින් හදවත හා අතද පෝෂණය කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළපොත මෙම ගුරු අත්පොතට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිතය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී,

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් ඵල වලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලා ඇතිව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිතය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරුභවතා පංති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා**
ව්‍යාපෘති නායක
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iv |
| විෂය මාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix - xix |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 57 |
| විවිධ සහය | 58 |

## විෂය හැඳින්වීම

යහ ගුණ පිරි සමාජයක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාව ය වේ. ඒ සඳහා ආගම මගින් සුවිසල් මෙහෙවරක් ඉටු කරයි. එවන් සමාජයක් කරා දරුවන් ප්‍රවිශ්ඨ කරවීම ආගමික විෂය මාලා ප්‍රතිසංස්කරණයේ අභිප්‍රායයි. පරිපූර්ණ දරුවකු තුළ දැනුම, ආකල්ප, කුසලතා පමණක් නොව අන්තර් පුද්ගල හැකියාවන් හා යහ ගුණ වර්ධනය කිරීම ද අපේක්ෂිත ය.

දරුවකුට දේව රාජ්‍යයේ ප්‍රතිපත්තීන්ට හා ගුණාංගවලට අනුකූල ව තම කිතුනු විශ්වාසය හා ඇදහිල්ල සවිමත් කර ගනිමින් ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය තුළ විදහා දැක්වීම සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සම්පාදනය කර ඇත.

ශුද්ධ බයිබලය තුළින් එළි දැක්වෙන දේව වචනය පදනම් කර ගනිමින් විශේෂිත වූ කිතුනු දැක්ම, පැවැත්ම හා සත්‍යතාවන් මත ප්‍රධාන නිපුණතා පහක් පාදක කර ගනිමින් 6-11 ශ්‍රේණි සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සකසා තිබේ.

11 වන ශ්‍රේණිය අවසාන වන විට තමා දිවි ගෙවන සමාජය තුළ පැන නැගෙන අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කරන හා ක්‍රිස්තුස් වහන්සේ තුළ තම ජීවිතය ගත කරන, සමාජය ආලෝකවත් කිරීමට හැකි දේව විශ්වාසයෙන් පරිපූර්ණ, නව යොවුන් කිතුනුවකු ලොවට දායාද කිරීම මෙම විෂය මාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශිෂ්‍ය කේන්ද්‍රිය සන්දර්භයක් හරහා ජීවිතාදර්ශයෙන් ක්‍රියා කරමින්, කිතුනු අනන්‍යතාවය දරන දේව රාජ්‍යයේ පුරවැසියන් පිරිසක් බිහි කිරීමට ඇප කැප වී ක්‍රියා කිරීම කිතුනු දහම් ගුරුවරයකුගේ මහඟු වගකීමයි. මේ සඳහා සිසුන් තුළ අදාළ නිපුණතා වර්ධනය කිරීමටත් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සංකල්ප හා ක්‍රියාකාරකම් සාර්ථක ලෙස යොදා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

කිතුනු සාක්ෂිය හා ස්ථිර සාර ඇදහිල්ල පෙරදැරි කරගත් ශ්‍රී ලාංකේය ජන ජීවිතය සවිමත් කරන හා ලොව නංවන විජයග්‍රාහී කිතුනුවන් රැසක් නිර්මාණය කිරීමට මෙම ක්‍රියාදාමය හරහා අවකාශ ලැබෙනු නො අනුමානය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාල වන ප්‍රධාන ජාතික අරමුණු කරා ලඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම් වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ලඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහු විධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමයේ ප්‍රවර්ධනය කිරීම තුළ ජාතිය ගොඩ නැගීමේ සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කිරීම.
2. වෙනස්වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන ජාතික උරුමයේ මා හැගි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ්වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයනට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප සහ කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා** සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන් චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජී වි ත ය ට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව ප හ සු ව , ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

1. දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද, නිර්මාතෘ ද බව විශ්වාස කරමින් උන්වහන්සේ අපට දුන් දේව දායාදයන් ප්‍රයෝජන ගැනීමටත්, සුරැකීමටත්, සංරක්ෂණය කිරීමටත් ක්‍රියා කරයි.

2. යාච්ඤාවෙන් සවිමත් වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත ප්‍රේමය අත්දකිමින් සමාජය ආලෝකවත් කිරීමට කටයුතු කරයි.

3. ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් තම දක්ෂතා, හැකියා යහපත් සමාජ මෙහෙවරකට හා ජාතික සංවර්ධනයට යොමු කිරීමට ක්‍රියා කරයි.

4. ජාතික හා අන්තර් ආගමික සුහදතාවය වර්ධනය කර ගනිමින් සාර ධර්මයෙන් හෙබි සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දේව රාජ්‍යයේ වටිනාකම් පිටිවහලක් කර ගනියි.

5. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට දේව වචනය අත්වැලක් කර ගනියි.

6. පරිණත කිතුනු ජීවිත ක්‍රියාකාරීත්වය තුළින් ක්‍රිස්තුස් වහන්සේ ලොවේ මාංශවත් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 01.<br>දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි. | 7.1.1 දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින බව අවධාරණය කර ගනියි. | 7.1.1දේව සුරක්ෂිතතාවය<br>උත්පත්ති 2:7-8 ශු මතෙව් 6:25-34, 18:6<br>(අනර්ඝතම මැවිල්ල ලෙස දරුවා සුරැකීමේ අවශ්‍යතාවය ඉස්මතු කරන්න.) | ● දේව සුරක්‍ෂිතභාවය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>● දේව සුරක්‍ෂිතභාවය අත්දකියි.<br>●දෙවියන් වහන්සේ මැවිල්ල සුරක්‍ෂිත කරන බව අන් අයට ප්‍රකාශ කරයි. | 3 |
| | 7.1.2 දේව මැවිල්ල සුරැකීමේ වගකීමට දායක වෙයි. | 7.1.2 මැවිල්ල සුරැකීමේ වගකීම<br>(උත්පත්ති 1: 28-30, 2: 15)<br>වත්මන් ලෝකය තුළ මැවිල්ල සුරැකීමේ වගකීම ඉටුකළ හැකි ආකාරය ( එවැනි ආයතන නම් කිරීම.) | ● දේව මැවිල්ල සුරැකිය යුතු ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දේව මැවිල්ල සුරැකිය යුතු බව පිළි ගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>● දේව මැවිල්ල සුරැකීමට යොමු වෙයි.<br>● දේව මැවිල්ල සුරැකීමට සාමුහිකව කටයුතු කරයි. | 2 |
| | 7.1.3 දේව මැවිල්ල තුළ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයේ ස්ථිර බව පැහැදිලි කර ගනියි. | 7.1.3 අඛණ්ඩ ව හා චක්‍රාකාර ව සිදුවන දේව මැවිල්ලේ තිරසාරත්වය, දිවා රෑ ඇති වීම, පැල හට ගැනීම, මල් පිපීම, දරුවන් හා සතුන් බිහි වීම, වඩදිය බාදිය ඇති වීම. (ජෝබ් 36:25-33) | ● දේව මැවිල්ලේ අඛණ්ඩත්වය හා චක්‍රාකාර බව පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දේව මැවිල්ල අඛණ්ඩ ව හා චක්‍රාකාර ව සිදුවන බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>● දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයේ තිරසාරත්වය පිළිබඳ විශ්වාස කරයි.<br>● දේව මැවිල්ල වර්ධනය කිරීමට සහයෝගයෙන් ක්‍රියා කරයි. | 2 |
| | 7.1.4 ජීවිත ගමන තුළ දී දේව ප්‍රේමයේ තිරසාරත්වය අත්දකියි. | 7.1.4 දේව ප්‍රේමයේ තිරසාරත්වය<br>(ගීතාවලිය 103:1-17) | ● දේව ප්‍රේමයේ තිරසාරත්වය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>● දේව ප්‍රේමයේ තිරසාරත්වය පිළිගනියි.<br>● තිරසාර දේව ප්‍රේමය පිළිබඳ අදහස් පෙළ ගස්වයි.<br>● සමාව දීමට යොමු වෙයි.<br>● එකිනෙකාට ගරුකරමින් කටයුතු කරයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 02.<br>ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි. | 7.2.1<br>ස්නාවක ජොහාන්තුමා ඉටු කළ පෙර මග දූත සේවය පිළිබඳ සොයා බලයි. | 7.2.1 ස්නාවක ජොහාන්තුමාගේ පෙර මග දූත සේවය.<br>(ශු. මතෙව් 3: 1-12) | ● ස්නාවක ජොහාන් තුමාගේ පෙර මග දූත සේවය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● ජේසුස් වහන්සේ පිළිගැනීම සඳහා දිවි මග සකස් කර ගත යුතු බව පිළිගනියි.<br>● ගීතමය රංගනයක් ඉදිරිපත් කරයි.<br>● සිය පාප පිළිබඳ ව මනස්ථාපනය වෙයි.<br>● අන් අය සමග නිහතමානී ව කටයුතු කරයි | 2 |
| | 7.2.2<br>ජේසුස් වහන්සේගේ පරීක්ෂා තුළින් ලද ජයග්‍රහණයෙන් ජීවිතයට පන්නරයක් ලබයි. | 7.2.2 පරීක්ෂාවන්ට මුහුණ දීම.<br>(ශු. ලූක් 4: 1-13, 22:40-43,<br>ශු. මාර්ක් 8:11-13, 15:29-32<br>ශු. ජොහාන් 6:14-15 | ● ජේසුස් වහන්සේ මුහුණ දුන් විවිධ පරීක්ෂා පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දේව බලය තුළ පරීක්ෂා ජය ගත හැකි බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරයි.<br>● එදිනෙදා ජීවිත පරීක්ෂා ජය ගනියි.<br>● ජීවිත පරීක්ෂා ජය ගැනීමට සිය මිතුරන්ට සහාය වෙයි. | 3 |
| | 7.2.3<br>ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලින් දිරිය ලැබ සමාජ මෙහෙවරෙ හි යෙදෙයි. | 7.2.3 කන්ද උඩ දේශනාවෙන් උද්දීපනය වන සමහර ඉගැන්වීම්.<br>රන් අණ (ශු. මතෙව් 7: 12)<br>පොළොවේ ලුණු හා ආලෝකය<br>(ශු. මතෙව් 5: 13-16) | ● ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ කරුණු රැස් කරයි.<br>● ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ජීවිතයට ඉතා වැදගත් බව පිළිගනියි.<br>● කන්ද උඩ දේශනයේ ඉගැන්වීම් පිළිබඳ කතාවක් පවත්වයි.<br>● රන් අණ අනුව ක්‍රියා කරයි.<br>● දිරියෙන් අන් අය සමඟ සමාජ මෙහෙවරෙහි යෙදෙයි. | 3 |
| | 7.2.4<br>ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙර සිදුවීම් පෙළ ගස්වයි. | 7.2.4 ආසන්න සිදුවීම්-<br>අවසාන රාත්‍රි භෝජනය<br>(ශු.මතෙව් 26:26-30)<br>පාද සේදීම. (ශු.ජොහාන් 13:1-20)<br>ගෙත්සෙමනේ යාච්ඤාව.<br>(ශු.මතෙව් 26: 36-46) | ● ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට ආසන්න සිදුවීම් පිළිබඳ කරුණු රැස් කරයි.<br>● නිරතුරුව ම ජේසුස් වහන්සේ සමග සම්බන්ධතාවයට ඇතුලත් විය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ආත්ම කථනයක් රචනා කරයි.<br>● යාච්ඤාවෙන් තීරණ ගැනීමට යොමු වෙයි..<br>● දේව කැමැත්ත මත නිහතමානීව ජීවිතය ගොඩ නගා ගැනීමට අන් අයට සහාය වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.2.5<br>ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය තුළින් සේවය පරිපූර්ණත්වයට පත්වීම අනාවරණය කර ගනියි. | 7.2.5 කුරුසියේදී පැවසු සුවිශේෂි වදන්<br>පියාණෙනි මොවුන්ට කමාවුව මැනව<br>(ශු.ලූක් 23: 34)<br>ස්ත්‍රිය මෙන්න නුඹේ පුත්‍රයා.<br>(ශු.ජොහාන් 19: 26-27)<br>සියල්ල නිම විය.<br>(ශු.ජොහාන් 19: 30) | • ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ සුවිශේෂී වදන් පෙළගස්වයි.<br>• ජේසුස් වහන්සේ ආදර්ශයට ගනිමින් සෑම කාර්යයක්ම සාර්ථකව නිම කළ යුතු බව පිළිගනියි.<br>• කෙටි නාට්‍ය පිටපතක් රචනා කරයි. .<br>• කුරුසියේ දී ජේසුස් වහන්සේ පැවසූ වදන් අනුගමනය කරයි.<br>• යහපත් කිතුනු ගුණාංග අන් අයගේ ජීවිත තුළ වර්ධනය කිරීමට දිරි දරයි. | 3 |
| | 7.2.6<br>ජේසුස් වහන්සේගේ පුනරුප්පිවනයේ බලාපොරොත්තුව තුළ දිවි ගෙවයි. | 7.2.6 ජේසුස් වහන්සේගේ පුනරුප්පිවනය.<br>(ජොහාන් 20:24-29) | • ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ජේසුස් වහන්සේ නැවත නැගිටි බව පිළිගනියි.<br>• පුනරුජ්ජීවනය පිළිබඳ නිර්මාණාත්මක ලිපියක් රචනා කරයි.<br>• උත්ථාන වූ ජේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ ලෙස විශ්වාස කරයි.<br>• පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ පිළිබඳ සුභාරංචිය අන් අය සමඟ බෙදා ගනියි. | 2 |
| 03. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජිවිත නවෝදයක් අත් දකියි. | 7.3.1<br>පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය පිළිබඳ සවිස්තරාත්මක හැදෑරීමකට යොමු වෙයි. | 7.3.1 ශුද්ධාත්ම ආගමනය.(ක්‍රියා 2: 1-13) | • පෙන්තකොස්ත දින සිදුවීම් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ වැඩ වසන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙ යි.<br>• ශුද්ධාත්ම මග පෙන්වීම පතා යාච්ඤා කරයි.<br>• ශුදධාත්මයාණෝ ජීවිතයට වැඩම කිරීමෙන් ලබන ජීවිත නවෝදය පිළිබඳ ව ප්‍රකාශ කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 04.<br>දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි. | 7.3.2<br>ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සවිමත් වූ මුල් කිතුනු සභාවෙන් ආදර්ශ ලබා ගනියි. | 7.3.2<br>මුල් කිතුනු සභාව.(ක්‍රියා 2: 37-47) | • මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ පිළිවෙළින් ගොනු කරයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ සභාව තුළ ක්‍රියාකරන බව පිළිගනියි.<br>• මුල් සභාවේ ලක්ෂණ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• තමා සතු දේ අන්‍යයන් සමග බෙදා ගනියි.<br>• එකමුතුව ගෘහ යාච්ඤා රැස්වීම් වලට සහභාගි වෙයි. | 3 |
| | 7.3.3<br>ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් නිරතුරුව ම තම ජීවිතය උද්දීපනය කර ගනියි. | 7.3.3<br>සුදර්ශන දොරටුව අසල සිටි කොර මිනිසකු සුවපත් කිරීම.<br>(ක්‍රියා 3: 1-10)<br>(දරුවන්ගේ ජීවිත තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය උද්දීපනය විය යුතු ආකාරය පැහැදිලි කරන්න.) | • කොර වූ මිනිසා ලැබූ සුවය පිළිබඳ සිද්ධියට අදාළ කරුණු ගොනු කරයි.<br>• දෙවියන් වහන්සේ මිනිසාට සුවය ලබා දෙන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙ යි.<br>• සුවය ලැබීමට ඇදහිල්ලෙන් යාච්ඤා කරයි.<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ ජීවිතයට දිරියක් හා නවෝදයක් වන බව ප්‍රකාශ කරයි. | 2 |
| | 7.4.1<br>කන්ද උඩ දේශනාවේ ඉගැන්වීම් තම ජීවිතයට පන්නරයක් කර ගනියි. | 7.4.1 සතුරන්ට ප්‍රේම කිරීම.<br>(ශු.මතෙව් 5: 43-48) යාච්ඤාව<br>(ශු. මතෙව් 6: 5 -15)<br>දෙවියන් වහන්සේ තුළ සවිමත් වීම. (ශු.මතෙව් 7:24-27) | • කන්ද උඩ දේශනාවේ ඉගැන්වීම් පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• සතුරාට ද ප්‍රේම කළ යුතු බව පිළි ගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>• සැමටම දේව කරුණාව හිමි වන බව විශ්වාස කරයි.<br>• එකමුතු ව පියාණන් වහන්සේට යාච්ඤා කරයි | 2 |
| | 7.4.2<br>යහ පැවැත්මෙන් යුතු සමාජයක් ගොඩ නැගීම සඳහා තම හැකියාවන් දායක කර ගනියි. | 7.4.2 හැකියාවන් වර්ධනය කිරීම.<br>(ශු.ලූක් 19: 11-27)<br>නොමග ගිය අය යහ මගට ගැනීම. (ශු.ලූක් 15: 1-7) | • යහපත් සමාජයක් ගොඩ නැගීමට තම හැකියා දායක කර ගත හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• අප ලද හැකියාවන් දේව ගෞරවය උදෙසා ක්‍රියාවට නැංවිය යුතු බව පිළිගනියි.<br>• නාට්‍යයක් ඉදිරිපත් කරයි.<br>• තම හැකියාවන් වර්ධනය කර ගනියි.<br>• නො මග ගිය අයට නිසි මග පෙන්වීමට ක්‍රියා කරයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.4.3<br>ජේසුස් වහන්සේ අනුගමනය කරමින් ක්‍රියාකාරී සේවයක නියැලෙයි. | 7.4.3 සැම හට සැම විට සේවය, දරුවන් (ශු.මාක් 10: 13-16) සමාරිත ස්ත්‍රිය. (ශු.ජොහාන් 4:7-10, 4:28-30, 39) | ● ජේසුස් වහන්සේ සැම හට සැම විට කළ සේවය පිළිබඳ කරුණු ගොනු කරයි<br>● සැම හට සැම විට සේවය කළ යුතු බව පිළි ගනියි.<br>● නාට්‍යය පිටපත් රචනා කරයි.<br>● සැම දෙනා පිළි ගනියි.<br>● සාක්ෂි දරමින් එකමුතුව සේවය කරයි | 3 |
| | 7.4.4<br>දේව රාජ්‍යයේ අනන්‍යතාවය සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | 7.4.4 භේද නොතකා සමාජ අවශ්‍යතාවල දී එක්ව ක්‍රියා කිරීම. (ගලාති 3: 28, ක්‍රියා 11: 27-30)<br>☀ උදා:- ව්‍යසන අවස්ථා. | ● සමාජ අවශ්‍යතාවල දී එක්ව ක්‍රියා කළ හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● භේද නොතකා උපකාර කළ යුතු බව පිළිගනියි.<br>● ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>● තමා සතු දේ බෙදා ගැනීමට යොමු වෙයි.<br>● සමාජයේ අවශ්‍යතා වලදී උපකාර කරයි. | 3 |
| 05.<br>ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි. | 7.5.1<br>ශුද්ධ බයිබලය ලේඛන ගත වීමේ මූලාරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි. | 7.5.1 මූලාශ්‍ර හා මූලාරම්භය පිළිබඳ හැඳින්වීම (ලේඛණ ගත වීම ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුලත් කරයි.) | ● ශුද්ධ බයිබලය ලේඛන ගත වීම පිළිබඳ කරුනු ගොනු කරයි.<br>● ශුද්ධ බයිබලය ලියවුනේ දෙවියන්වහන්සේගේ අනුහසින් බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>● ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරයි.<br>● එකමුතුව දේව වචනය මෙනෙහි කරයි. | 1 |
| | 7.5.2<br>මේරි ජෝන්ස් හා තෝමස් චාල්ස් ශුද්ධ බයිබලයේ ව්‍යාප්තිය සඳහා ප්‍රයත්න දැරූ ආකාරය අධ්‍යයනය කරයි. | 7.5.2 මේරි ජෝන්ස් හා තෝමස් චාල්ස්, බයිබල් සමාගම්. විලියම් කේරි | ● ශුද්ධ බයිබලයේ ව්‍යාප්තිය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● දේව වචනයෙන් පෝෂණය ලැබිය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි.<br>● ශුද්ධ බයිබලය තම ජීවිතයට අත්වැලක් කර ගනියි.<br>● දේව වචනය ව්‍යාප්තිය සඳහා සාමූහික ව දායක වෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.5.3<br>ශුද්ධ බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්තනය වීම පිළිබඳ තොරතුරු හදාරයි. | 7.5.3 විවිධ පරිවර්තන දේශීය බසින් පරිවර්තනය | • ශුද්ධ බයිබලය පරිවර්තනය වී ඇති විවිධ භාෂාවන් ගැන තොරතුරු රැස් කරයි.<br>• විවිධ භාෂාවන්ට පරිවර්ථනය වීම නිසා ශුද්ධ බයිබලය පහසුවෙන් තේරුම් ගත හැකි බව පිළිගනියි.<br>• පොත් පිංචක් නිර්මාණය කරයි.<br>• දිනපතා ශුද්ධ බයිබලය කියවයි.<br>• එකමුතුව ශුද්ධ බයිබලය අධ්‍යයනය කරයි. . | 2 |
| | 7.5.4<br>සෙසු ආගමික ලියවිලි පිළිබඳ අවබෝධයක් ලබමින් සහජීවනයෙන්කටයුතු කරයි. | 7.5.4 ආගමික ලියවිලි, ත්‍රිපිටකය, කුරාණය, වේද ග්‍රන්ථ | • සෙසු ආගමික ලියවිලි ගැන ගැන තොරතුරු ගොනු කරයි.<br>• සෑම ආගමකට ම ඇති ආගමික ලියවිලි අගය කරයි.<br>• පෝස්ටරයක් නිර්මාණය කරයි.<br>• අන්‍ය ආගම්වලට ගරු කරයි.<br>• සෙසු ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරයි. | 1 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1:0** **:** දෙවියන් වහන්සේ සියල්ලේ කතෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 7.1.1** දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින බව අවධාරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- දේව සුරක්ෂිතභාවය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- දේව සුරක්ෂිතභාවය අත්දකියි.
- දෙවියන් වහන්සේ මැවිල්ල සුරක්ෂිත කරන බව අන් අයට ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- කුරුළු කූඩුවක සිටින කිරිල්ලියක් තම පැටවුන්ට රැකවරණය දෙන ආකාරය දක්වන රූපයක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ මෙනෙහි කිරීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - කිරිල්ලිය තම පැටවුන්ට ආදරය කිරීම.
  - පැටවුන්ට රැකවරණය දෙන බව.
  - දෙවියන් වහන්සේ මිනිසාට ප්‍රේම කරන බව.
  - මෙලොව ඇති සියල්ල මවා දුන් බව.
  - මැවිල්ල තුළින් අප නිසි ප්‍රයෝජන ගත යුතු බව.

(මිනිත්තු 25)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - දෙවියන් වහන්සේ මිනිසා දූවිල්ලෙන් මැවූ බව (උත්පත්ති 2: 7-8)
  - මිනිසාට ජීවන හුස්ම ලබාදීම.
  - දේව මැවිල්ල තුළ ප්‍රධාන තැනක් මිනිසාට ලබා දී ඇති බව.

- දේව මැවිල්ලේ නිර්මාතෘවරයාණන් වන දෙවියන් වහන්සේ මැවිල්ල සුරකින බව (ශු. මතෙව් 6ඃ 25-34)
- වර්තමාන සමාජය තුළ මැවිල්ලට අයත් දරුවා සුරක්ෂිත කිරීම. (ශු.මතෙව්18ඃ6)
- අපගේ අවශ්‍යතාවයන් පිළිබඳ අනවශ්‍ය ලෙස කරදර නොවීම.

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** :
- ශුද්ධ බයිබලය උත්පත්ති 2ඃ 7-8, ශු. මතෙව් 6ඃ 25-34, ශු. මතෙව් 18ඃ 6
- තම පැටවුන්ට රැකවරණය දෙන කිරිල්ලියකගේ පින්තූරයක්.
- ඒ 4 කඩදාසි, පෑන්, බ්‍රිස්ටල් බෝඩ්.

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1 : 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

.

1 කණ්ඩායම

I
- මිනිසා දේව මැවිල්ල විනාශ කරන ආකාර 10 ක් හා දේව මැවිල්ල සුරක්ෂිත කිරීමට මිනිසාට ගත හැකි පියවර 10 ක් ලියා දක්වන්න.

II
- ශු. මතෙව් 6ඃ 25-34 ට කියවන්න
- දෙවියන් වහන්සේ සියල්ල සැපයීම තුළින් සුරක්ෂිතභාවය ලබාදෙන ආකාරය කෙටියෙන් ලියා දක්වන්න.

2 කණ්ඩායම

I
- දරුවන්ගේ සුරක්ෂිතතාවය ඇති කිරීමට ඔබ යෝජනා කරන ක්‍රියා මාර්ග ලියා දක්වන්න. එවැනි ආයතන කීපයක නම් ලියන්න.

II
- ශු. මතෙව් 18ඃ 6 හි සඳහන් ආකාරයට දරුවන් පිළිබඳ පවසා ඇති වදන් අනුව වත්මන් ලොව තුළ ඔවුන් සුරක්ෂිත කළ හැකි ආකාරය ලියා දක්වන්න.

**ගෙදර පරිසරයෙන්**

.

දෙවියන් වහන්සේ දුන් තම වටිනා ජීවිතය ආරක්ෂා කර ගැනීමට හුරු කරවන්න.

**නිපුණතාව 1:0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 7.1.2 :** දේව මැවිල්ල සුරැකීමේ වගකීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දේව මැවිල්ල සුරැකිය යුතු ආකාරය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දේව මැවිල්ල සුරැකිය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- දේව මැවිල්ල සුරැකීමට යොමු වෙයි.
- දේව මැවිල්ල සුරැකීමට සාමූහික ව කටයුතු කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුනට පැහැදිලිව කියවීමට හැකි පරිදි හුණු පුවරුවේ ලියා තබන්න.
- අදාල චරිතවලට බෙදී සිසුන්ට එය තාලයකට අනුව කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - දෙවියන් වහන්සේ සියල්ල මවා දුන් බව
    - දෙවියන් වහන්සේ මවා දුන් සියල්ල අපට ප්‍රයෝජනවත් බව.
    - දෙවියන් වහන්සේ මවා දුන් සියල්ල ආරක්ෂා කළ යුතු වීම.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - මිනිසා උතුම් මැවිල්ල බව
    - දේව මැවිල්ල පාලනය මිනිසාට ලබාදීම (උත්පත්ති 1:28-30, 2:15)
    - දේව මැවිල්ල රැකබලා ගැනීමේ වගකීම දෙවියන් වහන්සේ මිනිසාට පැවරීම.
    - මැවිල්ල වැඩි වර්ධනය කිරීමට මිනිසා යොමු විය යුතු බව.
    - පරිසරය සුරැකීමට පාසල් මට්ටමින් ක්‍රියා කිරීම. උදා: ඔසු උයනක් සැකසීම

- ප්‍රදේශයට ආවේනික ගස්වැල් වගා කිරීම.

- ගෙවත්ත අලංකාර කිරීමට යොමු වීම.

- මැවිල්ල සුරැකීමේ සාමූහික ප්‍රයත්න (මධ්‍යම පරිසර අධිකාරිය, එක්සත් ජාතීන්ගේ සංවිධානය, රාජ්‍ය නොවන සංවිධාන, පරිසර ව්‍යාපෘති.)

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -උත්පත්ති 1:28-30, 2:15
පාට ඒ 4 කඩදාසි
ගම්, කතුරු, බ්‍රිස්ටල් බෝඩ්
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම
- උත්පත්ති 1:28-30 හා උත්පත්ති 2:15 කියවන්න.
- දෙවියන් වහන්සේ මැවිල්ල සම්බන්ධයෙන් මිනිසාට පැවරූ වගකීම් මොනවා දැයි හඳුනාගන්න.
- ඒවා පිටු පෙරලනයක් මගින් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න

2 කණ්ඩායම
- උත්පත්ති 1:28-30 හා උත්පත්ති 2:15 කියවන්න.
- මැවිල්ල රැක බලා ගැනීම අපේ වගකීම බව ප්‍රකාශ කෙරෙන වැකි නිර්මාණය කරන්න.
- ඒවා අදාල ස්ථාන වල ප්‍රදර්ශනය කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

1. **අවට අපිරිසිඳු කරන සොයුරියක් අමතා**
   අක්කාඃ පුංචි නංගි මෙහේ එන්න - කුණු රොඩු ටික අතට ගන්න
   තැන් තැන් වල වීසි නොකර - නිසි තැනකට ගොස් දමන්න

2. **වතුර අපතේ යවන තම දුව අමතා**
   අම්මාඃ පුංචි දුවේ මේ අහන්න - එපා වතුර විසි කරන්න
   දිය බිඳකින් දිවිය රැකෙන - බව නිතරම සිහි කරන්න

3. **පුංචි පැල පාගා දමන , අතු, ඉති කඩා විසුරන පුංචි පුතා අමතා**
   තාත්තාඃ ගත සනසන සීත සුලඟ - දිව පිනවන රස එල වැල
   අප හට දෙන තුරු පිරිවර - සුරැකීමට සිතට ගන්න

4. **සතුන්ගේ නිදහසට බාධා කරන පුංචි මල්ලි අමතා**
   අයියාඃ පැන යන පොඩි හා පැටවුන් - ඉගිලී යන සමනලයින්
   අල්ලා හිංසා නොකලොත් - තුටුවෙයි අප දෙවි සමිඳුන්

**ගෙදර පරිසරයෙන්**

අවට පරිසරය පිරිසිඳුව තබා ගැනීමට හුරු කරවන්න.

**නිපුණතාව 1:0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 7.1.3 :** දේව මැවිල්ල තුළ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයේ ස්ථිර බව පැහැදිලි කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- දේව මැවිල්ලේ අඛණ්ඩත්වය හා චක්‍රාකාර බව පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දේව මැවිල්ල අඛණ්ඩ ව හා චක්‍රාකාර ව සිදුවන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයේ තිරසාරත්වය පිළිබඳ විශ්වාස කරයි.
- දේව මැවිල්ල වර්ධනය කිරීමට සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් පහසු පරිදි අසුන් ගන්වා දෑස් පියා ගැනීමට අවස්ථාව සලස්වන්න.
- පසුගිය දවස පුරා පැවති පරිසරයේ ස්වභාවය මෙනෙහි කිරීමට සලස්වන්න.
- ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - උදය, දහවල, රාත්‍රිය උදාවූ බව
    - සිසිලසක් දැනුණු බව
    - උණුසුමක් දැනුණු බව
    - මල් පිපුණු බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - අදටත් දේව මැවිල්ලේ ක්‍රියාකාරිත්වය සිදුවන බව (ජෝබ් 36:25-33)
    - දේව මැවිල්ලේ අඛණ්ඩ බව හා චක්‍රාකාර බව
      උදා:- දිවා රාත්‍රිය ඇති වීම, මල් පිපීම, පැල හට ගැනීම. වඩදිය බාදිය ඇති වීම.
    - මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය ලෝකයේ පැවැත්මට උපකාරී වීම.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ජෝබ් 36: 25 - 33
ඒ 4 කඩදාසි
පාට පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

- ජෝබ් 36:25-33 කියවන්න.
- ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

1 කණ්ඩායම

අඛණ්ඩව සිදුවන දේව මැවිල්ල ගැන තුති පුදමින් යාච්ඤාවක් ලියන්න.

2 කණ්ඩායම

'දේව මැවිල්ලේ අඛණ්ඩ බව හා එහි තිරසාරත්වය' මැයෙන් සඟරාවකට ලිපියක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

දේව මැවිල්ලේ තිරසාරත්වය පිළිබඳ තුති පුදමින් යාච්ඤාවට යොමු කරවන්න.

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 7.1.4 :** ජීවිත ගමන තුළ දී දේව ප්‍රේමයේ තිරසාරත්වය අත්දකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- දේව ප්‍රේමයේ තිරසාරත්වය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දේව ප්‍රේමයේ තිරසාරත්වය පිළිගනියි.
- තිරසාර දේව ප්‍රේමය පිළිබඳ අදහස් පෙළ ගස්වයි.
- සමාව දීමට යොමු වෙයි.
- එකිනෙකාට ගරුකරමින් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුන් අතට පත් කර සිසුන් සමඟ ගායනා කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මනහර ලෝකය තුළින් දේව ප්‍රේමය අත්දැකිය හැකි වීම.
  - දෙවියන් වහන්සේ අප රෝග විපත් වලින් ආරක්ෂා කරන බව
  - විනාශ මුඛයෙන් බේරා ගන්නා බව
  - දේව ප්‍රේමය සීමා රහිත බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - දෙවි සමිඳුන් අපට ප්‍රේම කරන බව.
  - සියළු රෝගවලින් ආරක්ෂා කොට යහපත් දෙයින් අප තෘප්තිමත් කරන බව (ගීතාවලිය 103 : 3)
  - පාපයෙන් අප ගලවා ප්‍රේමය හා දයාව නමැති කිරුලෙන් අප සරසන බව (ගීතාවලිය 103 : 4)
  - අනුකම්පාවෙන් හා දයාවෙන් පූර්ණව අපට කරුණාව දක්වන බව. (ගීතාවලිය 103 : 8)
  - පියකු වැරදි වලට කමාව දානය කරන්නාක් මෙන් දෙවියන් වහන්සේ අපට කමාව දෙන බව. (ගීතාවලිය 103 : 13)
  - සමිඳුන්ගේ තිරපෙම සදාකාලික ය.(ගීතාවලිය 103 : 17)
  - දෙවියන් වහන්සේගේ තිර පෙම පිළිබඳ විශ්වාස කිරීම. (ගීතාවලිය 103 : 18)
  - දෙවියන් වහන්සේට ගරුබිය දැක්විය යුතු බව.

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ගීතාවලිය 103 ፡ 1-18
ඒ 4 කඩදාසි
පාට පැන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ගීතාවලිය 103፡1-17 කියවා දේව ප්‍රේමයේ තිරසාරත්වය පිළිබඳ ප්‍රකාශ කර ඇති අදහස් පෙළ ගස්වන්න.

2 කණ්ඩායම

ගීතාවලිය 103፡1-17 කියවන්න.
ජීවිත ගමන තුල දී දේව ප්‍රේමයේ තිරසාරත්වය අත් දැකිය හැකි අවස්ථා ලියා දක්වන්න.

## ඇමුණුම 2

**ක්‍රිස්තියානි ගීතිකා පොතේ 317 ගීතිකාව**

1 බලැති දේව සමිඳුනේ
ඔබ හැර අපටා
මෙලොව නැත්තේ කිසි කෙනෙක්
තිර පෙමයෙන් යුත් වු

2 අපට ඕනැ කොයි දෙයත්
යදින්නේ ඔබගෙනුයි
සැම හොඳ දේම දෙන්නේ අප හට
පෙමැති ඔබ තුමයි

3 බලැති දේව සමිඳුනේ
ගැළවුම් කරු ඔබයි
පරීක්ෂාවන් එද්දි අප හටා
ගළවන්නෙත් ඔබමයි

4 මරණයේ මිටියාවත් මැදින්
රකින්නෙත් ඔබ තුමයි
යහමග පෙන්වා දෙමින් අප සැම
ගෙනයන්නෙත් ඔබමයි

**ගෙදර පරිසරයෙන්**

දේව ගරු බිය ඇතිව ජීවත් වීමට හුරු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.1** : ස්නාවක ජොහාන් තුමා ඉටුකළ පෙර මග දූත සේවය පිළිබඳ ව සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ස්නාවක ජොහාන් තුමාගේ පෙර මග දූත සේවය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ පිළිගැනීම සඳහා දිවි මග සකස් කර ගත යුතු බව පිළිගනියි.
- ගීතමය රංගනයක් ඉදිරිපත් කරයි.
- සිය පාප පිළිබඳ ව මනස්තාපනය වෙයි.
- අන් අය සමග නිහතමානී ව කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- විශේෂ පුවත් ගෙන එන්නකු ලෙස කලින් සූදානම් කරගත් සිසුවෙකුට/සිසුවියකට පන්තිය ඉදිරියට පැමිණීමට අවස්ථාව ලබා දෙන්න.
- රබාන ගසමින් ඔහු/ඇය ඉදිරිපත් කරන පණිවුඩයට හොඳින් සවන් දීමට සලස්වන්න. (ඇමුණුම2)
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - විශේෂ පුවත් ගෙන එන්නකුගේ පණිවුඩ මගින් මිනිසුන්ගේ කුතුහලය වැඩිවන අයුරු.
  - ස්නාවක ජොහාන් තුමා ජේසුස් වහන්සේගේ පෙර මග සූදානම් කළ තැනැත්තා බව.
  - ජේසුස් වහන්සේගේ පෙර මග සූදානම් කිරීම සඳහා ස්නාවක ජොහාන් තුමා විශේෂ සේවාවක් ඉටු කළ ආකාරය.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න

.

- ස්නාවක ජොහාන් තුමා ජුදයේ පාළුකරයේ සිය දූත සේවය ඉටු කළ බව. (ශු. මතෙව් 3:1)
- ස්නාවක ජොහාන් තුමාගේ පෙර මග දූත සේවය මගින් දිවැසිවර යෙසායාගේ දිවැස් වැකිය සම්පූර්ණ වූ අයුරු. (ශු. මතෙව් 3:2-3)
- පෙරමඟ දූත සේවය ඉටුකළ ස්නාවක ජොහාන් තුමා චාම් සරළ දිවි පෙවතක් ගත කළ බව. (ශු. මතෙව් 3:4-5)
- මනස්තාපනයේ දූත සේවයට ප්‍රමුඛතාවක් ලැබීම (ශු. මතෙව් 3:6-11)

- පෙර මග දූත සේවය ස්නාවක ජොහාන් තුමාගේ නිහතමානීත්වය තුළින් ඔප් නැංවණු බව. (ශු. මතෙව් 3:12)
- මනස්ථාපනය තුළින් අප, ජේසුස් වහන්සේ අපගේ ජීවිත තුළට පිළිගත යුතු බව.
- නිහතමානී වෙමින් අප හැකි සෑම විට ම දෙවිඳුන්ට සේවය කළ යුතු වීම.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. මතෙව් 3:1-12
විශේෂ පුවත් ගෙන එන්නාට සුදුසු ඇඳුම්, රබානක්
ඒ 4 කොල
පෑන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

1 කණ්ඩායම
ශු. මතෙව් 3:1-12 කියවන්න. 'සරල බවේ දූත සේවය' නමින් කෙටි ගීතමය රංගනයක් ඉදිරිපත් කරන්න.
(කණ්ඩායමට සුදුසු පරිදි ගීතය නිර්මාණය කරන්න)

2 කණ්ඩායම
ශු. මතෙව් 3:1-12 කියවන්න.
මනස්ථාපනයේ දූත සේවය නමින් ගීතමය රංගනයක් ඉදිරිපත් කරන්න.
(කණ්ඩායමට සුදුසු පරිදි ගීතය නිර්මාණය කරන්න)

3 කණ්ඩායම
ශු. මතෙව් 3:1-12 කියවන්න.
නිහතමානී බවේ දූත සේවය නමින් ගීතමය රංගනයක් ඉදිරිපත් කරන්න
(කණ්ඩායමට සුදුසු පරිදි ගීතය නිර්මාණය කරන්න)
තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වෙන්න.

**ඇමුණුම 2**

1.ගෙන ආවේ අද දින
විශේෂ පුවතකි මම
සවන් දෙන්න සැම දෙනාම
යොමා ඔබේ දෙසවන

2.පිළි ගන්නට කිතු හිමි
සිත් පහදා ගනු නිති
නිර්මල සිතකට පමණයි
වඩිනට හැකි ඒ හිමි

3.සිතට ගන්න සැම විට
පව් සමාව ලබනට
හැකි නම් පව් නො කර ඉන්න
පුළුවනි ජය ගන්නට

4.යහපත් දිවි පැවතුම
අගය කරයි හිමි තුම
හිමි සමඟ ම ඉදිරියට ම
යන්නට කැප වෙමු අප

**ගෙදර පරිසරයෙන්**

මනස්ථාපනයේ ජීවිතයක් ගත කිරීමට යොමු කරවන්න

**නිපුණතාව 2:0** **:** ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම7.2.2 :** ජේසුස් වහන්සේගේ පරීක්ෂා තුළින් ලද ජයග්‍රහණයෙන් ජීවිතයට පන්නරයක් ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ මුහුණ දුන් විවිධ පරීක්ෂා පිළිබඳ කරුණු ගොනු කරයි.
- දේව බලය තුළ පරීක්ෂා ජය ගත හැකි බව පිළිගනියි.
- නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරයි.
- එදිනෙදා ජීවිත පරීක්ෂා ජය ගනියි.
- ජීවිත පරීක්ෂා ජය ගැනීමට සිය මිතුරන්ට සහාය වෙයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- කලින් සූදානම් කරගත් පරිදි සිසුන් දෙදෙනකු පන්තිය ඉදිරියට කැඳවා, ළමයින් පරීක්ෂාවට වැටෙන ආකාරය පිළිබඳ ව කෙටි කතා 2 ක් ඔවුන් මගින් පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඕනෑම මොහොතක අප පරීක්ෂාවට හසුවිය හැකි බව.
  - විවිධ පරීක්ෂා වලට අප හසුවීම.
  - පරීක්ෂා ජය ගැනීමට ශක්තිය අවශ්‍ය වීම.
  - ජේසුස් වහන්සේ ද පරීක්ෂා වලට මුහුණ දුන් බව.

(මිනිත්තු 15)

)පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ජේසුස් වහන්සේ විවිධ පරීක්ෂා වලට මුහුණ දුන් බව.
  - ජේසුස් වහන්සේ දින 40 ක් මුළුල්ලේ පාළුකරයේ සිටියදී පරීක්ෂා වලට මුහුණ පෑම. (ශු. ලූක් 4: 2-12)
  - ජේසුස් වහන්සේ දේව වචනය තුළින් පරීක්ෂා ජය ගැනීම. (ශු. ලූක් 4: 8, 10, 11, 12)
  - ස්වර්ගයෙන් හාස්කමක් කිරීමට ඉල්ලීම. (ශු. මාක් 8: 11-13)
  - ජේසුස් වහන්සේ රජකමට පත් කිරීමට ජනතාව උත්සාහ කිරීම. (ශු. ජොහාන් 6: 14-15)
  - ගෙත්සෙමන උයනේ දී ඇති වූ පරීක්ෂාව. (ශු. ලූක් 22: 40-43)
  - කුරුසියෙන් බැස ඒමට සරදම් කිරීම. (මාක් 15: 29-32)
  - ජේසුස් වහන්සේ පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කළ අයුරු.
  - බලය විදහා දැක්වීමට ඇති වන පරීක්ෂා ප්‍රතික්ෂේප කිරීම.
  - ජීවිත ගැටළු වලට මුහුණ දී ජය ලබාගත යුතු බව.

- දිනපතා පරීක්ෂා වලට මුහුණ දීමේදී දේව බලය තුළ දිරිය හා සවිය අයැදිය යුතු බව.

( මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය ශු. ලූක් 4: 1-13, ශු. මාක් 8: 11-13, ශු. ජොහාන් 6: 14-15, ශු. මාක් 15: 29-32, ශු. ලූක් 22: 40-43
- ළමයින් පරීක්ෂාවට වැටෙන ආකාරය පිළිබඳ කෙටි කතා 2 ක්,
- ඒ 4 කඩදාසි, මාකර් පෑන්, පාට පැන්සල්
- ඇමුණුම I

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

1 වන කණ්ඩායමः

- ශු. ලූක් 4: 1-13 දක්වා කියවන්න
- ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹීමට පෙර මුහුණ දුන් පරීක්ෂා හා ඊට සැපයූ පිළිතුරු වෙන වෙනම පෙළ ගස්වන්න.
- ශු. මාක් 8: 11-13 හා ශු. මාක් 15: 29-32 කියවන්න.
- ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- 'හාස්කම් කිරීමේ පරීක්ෂා ජය ගත් ජේසුස් වහන්සේ' යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් ලියන්න.

2 වන කණ්ඩායම

- ශු. ලූක් 4: 1-13 දක්වා කියවන්න
- ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹීමට පෙර මුහුණ දුන් පරීක්ෂා හා ඊට සැපයූ පිළිතුරු වෙන වෙන ම පෙළ ගස්වන්න.
- ශු. ජොහාන් 6: 14-15 පාඨය කියවන්න.
- ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- 'බලය විදහා පෑමේ පරීක්ෂාව ජය ගත් ජේසුස් වහන්සේ' යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් ලියන්න.

3 වන කණ්ඩායම

- ශු. ලූක් 4: 1-13 දක්වා කියවන්න.
- ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹීමට පෙර මුහුණ දුන් පරීක්ෂා හා ඊට සැපයූ පිළිතුරු වෙන වෙන ම පෙළ ගස්වන්න.
- ශු. ලූක් 22: 40-43 පාඨය කියවන්න.
- ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- 'පහසු මග ගමන් කිරීමේ පරීක්ෂාව ජය ගත් ජේසුස් වහන්සේ' යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

යාච්ඤාවෙන් හා දේව මග පෙන්වීමෙන් ජීවිත පරීක්ෂා ජය ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.3** : ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලින් දිරිය ලැබ සමාජ මෙහෙවරෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ කරුණු රැස් කරයි.
- ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ජීවිතයට ඉතා වැදගත් බව පිළිගනියි.
- කන්ද උඩ දේශනයේ ඉගැන්වීම් පිළිබඳ කතාවක් පවත්වයි.
- ලුණු හා ආලෝකය සේ වෙමින් රන් අණ අනුව ක්‍රියා කරයි.
- දිරියෙන් අන් අය සමඟ සමාජ මෙහෙවරෙහි යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- රන් පැහැය සහිත ආභරණය, ලුණු හා දැල්වූ ඉටිපන්දම පන්තිය ඉදිරියේ මේසයක් මත තබන්න.
- සිසුන්ට කඩදාසි ලබාදී ඒ එක් එක් ද්‍රව්‍ය සම්බන්ධ ව කැමති අදහසක් ලියා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - රන් ඉතා වටිනා ද්‍රව්‍යයක් බව.
  - ලුණු ආහාර රසවත් කරන බව.
  - ආලෝකය හේතුවෙන් අන්ධකාරය පහව යාම.
  - ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා විවිධ ද්‍රව්‍ය යොදාගත් බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනය යහපත් ජීවිතයකට මාර්ගෝපදේශයක් බව
  - රන් අණ කිතුනු ප්‍රේමයට පදනමක් සපයන අයුරු. (ශු. මතෙව් 7:12)
  - පොළොවේ ලුණු මෙන් වැයවීමේ සේවයක යෙදීම. (ශු. මතෙව් 5:13)
  - ආලෝකය වෙමින් අන අයගේ ජීවිත ආලෝකවත් කිරීම.(ශු. මතෙව් 5:14-16)
  - ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව ජීවිත හැඩ ගස්වා ගත යුතු බව.
  - සමාජයට සේවය කිරීම සඳහා ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුළින් දිරිය ලැබීම

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය ශු. මතෙව් 5:13-16, 7:12
රන් පැහැති ආභරණයක්
ලුණු
ඉටිපන්දම්,
ඉටිපන්දම් රඳවනයක්
ගිනි පෙට්ටිය
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

.

1 කණ්ඩායම

ශු. මතෙව් 7:12 කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

"රන් අණ අනුව ක්‍රියා කරමු" යන මාතෘකාව යටතේ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයකු ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම

ශු. මතෙව් 5:13 කියවන්න.
ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.

"පොළොවේ ලුණු වෙමු" යන මාතෘකාව යටතේ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයකු ඉදිරිපත් කරන්න.

3 කණ්ඩායම

ශු. මතෙව් 5:14-16 දක්වා කියවන්න.
ඒ පිළිබඳව සාකච්ඡා කරන්න.

"ලෝකයේ ආලෝකය අපි වෙමු" යන මාතෘකාව යටතේ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයකු ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා දේව වචනය කියවීමේ දී කන්ද උඩ දේශනයේ ඉගැන්වීම් යොදා ගැනීමට මග පෙන්වන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.4** : ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙර සිදුවීම් පෙළ ගස්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට ආසන්න සිදුවීම් පිළිබඳ කරුණු රැස් කරයි.
- නිරතුරුව ම ජේසුස් වහන්සේ සමග සම්බන්ධතාවයට ඇතුලත් විය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ආත්ම කථනයක් රචනා කරයි.
- යාච්ඤාවෙන් තීරණ ගැනීමට යොමු වෙයි..
- දේව කැමැත්ත මත නිහතමානී ව ජීවිතය ගොඩ නගා ගැනීමට අන් අයට සහාය වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- " මේ මාගේ ශරීරය, මේ මාගේ රුධිරයය" කියා ලියූ පුවරුව ද,
"මම ඔබේ පාද සේදුවේ නම් ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය" යන පුවරුව ද,
"පියාණෙනි හැකි නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව, එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා''යන පුවරුව ද පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
    - ජේසුස් වහන්සේ එක් එක් අවස්ථාවල විශේෂ වදන් පැවසූ බව.
    - ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සමග රොටි හා මිදි යුෂ බෙදා ගැනීම
    - ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදූ බව.
    - ශ්‍රාවකයන් ති දෙනෙකු හා ජේසුස්වහන්සේ ගෙත්සෙමන උයනට යාම.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - දුක් ප්‍රාප්තියට පෙර ජේසුස් වහන්සේ මුහුණ දුන් සිදුවීම් හි ඇති අති විශිෂ්ට බව
    - ජේසුස් වහන්සේ සිය දුක් ප්‍රාප්තියට පෙර අන්තිම රාත්‍රී භෝජනය පැවැත්වූ බව (ශු මතෙව් 26: 26 - 30)
    - අන්තිම රාත්‍රී භෝජනයේදී ජේසුස් වහන්සේ රොටි හා මිදියුෂ මගින් සිය ශරීරය හා රුධිරය සංකේතවත් කළ බව.

- ශ්‍රාවකයන්ගේ පාද සේදීමෙන් ජේසුස් වහන්සේ නිහතමානී සේවයේ වැදගත්කම කියාදීම. (ශු ජොහාන් 13ඃ 1-20)

- ගෙත්සෙමන උයනේ යාච්ඤාවේ දී ජේසුස් වහන්සේ දේව කැමැත්තට හිස නැමූ ආකාරය (ශු. මතෙව් 26ඃ 36-46)

- ජේසුස් වහන්සේට දිනපතා සම්බන්ධ වී දිවි ගෙවිය යුතු බව.

- නිහතමානී ව අන් අයට සේවය කිරීම

- නිරතුරුව ම දේව කැමැත්තට හිස නැමීමේ වැදගත්කම

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ශු. මතෙව් 26:26-30, ශු. ජොහාන් 13:1-20, ශු. මතෙව් 26:36-46
ශුද්ධ ලියවිලි පාඨ ලියූ පුවරු
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

1 කණ්ඩායම

ශු. මතෙව් 26:26-30 කොටස කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'ඔබ අන්තිම රාත්‍රී භෝජනයට සහභාගී වූ ජොහාන් 'යැයි සිතා ඒ පිළිබඳ ආත්ම කථනයක් ලියන්න.

2 කණ්ඩායම

ශු. ජොහාන් 13:1-20 දක්වා කොටස කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'ඔබ ජේසුස් වහන්සේ විසින් පාද සෝදන ලද පේදුරු 'යැයි සිතා ඒ පිළිබඳව ආත්ම කථනයක් ලියන්න.

3 කණ්ඩායම

ශු. මතෙව් 26:36-46 දක්වා කොටස කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'ඔබ ජේසුස් වහන්සේ සමග ගෙත්සෙමන උයනේ යාච්ඤා කිරීමට ගිය ජාකොබ්' යයි සිතා ඒ පිළිබඳ ව ආත්ම කථනයක් ලියන්න.

ඔබේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්**

කිතුනු සභා, වත් පිළිවෙත් නිසි පරිදි ඉටු කිරීමට මග පෙන්වන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.5** : ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය තුළින් සේවය පරිපූර්ණත්වයට පත්වීම අනාවරණය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ සුවිශේෂී වදන් පෙළ ගස්වයි.
- ජේසුස් වහන්සේ ආදර්ශයට ගනිමින් සෑම කාර්යයක්ම සාර්ථකව නිම කළ යුතු බව පිළිගනියි.
- කෙටි නාට්‍ය පිටපතක් රචනා කරයි. .
- කුරුසියේ දී ජේසුස් වහන්සේ පැවසූ වදන් අනුගමනය කරයි.
- යහපත් කිතුනු ගුණාංග අන් අයගේ ජීවිත තුළ වර්ධනය කිරීමට දිරි දරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 පෙර සූදානමින් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - කමාව දීම උදාර ගතියක් බව.
  - දෙමාපියන්ට සැලකීමේ වටිනාකම
  - යම් වැඩක් වෙලාවට නිම කිරීමේ වැදගත්කම

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ජේසුස් වහන්සේ කුරුසියේ දී සුවිශේෂී වදන් පැවසූ ආකාරය.
  - ජේසුස් වහන්සේ සතුරන්ට කමාව දීම (ශු. ලූක් 23:34)
  - සිය මව වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම. (ශු. ජොහාන් 19:26-27)
  - ජේසුස් වහන්සේ තම මෙහෙය සාර්ථක ව නිම කිරීම. (ශු. ජොහාන් 19:30)
  - ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ වදන් මගින් අප ජීවිත වලට වටිනා පාඩම් උගත හැකි බව.
  - නිරතුරු ව සතුරන්ට කමාව දීමට නැඹුරු වීම.
  - දෙමාපියන්ට යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම.
  - කාර්යයන් සාර්ථකව නිම කිරීමේ අවශ්‍යතාව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. ලූක් 23 : 34, ශු. ජොහාන් 19:26-27, ශු. ජොහාන් 19:30
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1,
ඇමුණුම 2 ඉදිරිපත් කිරීමට අවශ්‍ය දෑ

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම
ශු. ලූක් 23:34 කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'සතුරන්ට කමාව' යන මාතෘකාව යටතේ කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.

2 කණ්ඩායම
ශු. ජොහාන් 19:26-27 දක්වා කොටස කියවන්න.
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'මව්පියන්ට සෙනෙහස' යන මාතෘකාව යටතේ කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.

ඔබේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

## ඇමුණුම 2

සීයා: එන්න, එන්න දරුවනි ඔබ සැමදෙනා ම දැන්
ගැටළු මොනවා දැයි ඇතිවූ හනික මට කියන්

විසල්: අනේ සීයේ අපේ අයියා සැම විට මා හට
කරදර කරනවා මම අද ගැහුවා ඔහු හට

සීයා: එය නම් හොඳ වැඩක් නොවෙයි මේ අහන්න පුත
කමාව දීමයි උදාර නිති සැම දන වෙත

සහනි: අම්මා තාත්තට නැත මා ගැන කරුණාවක්
සැම විට වැඩ කරනට ඇත නොමැත නිදහසක්

සීයා: දෙමාපියන් හට සෙනෙහස පානා දරුවන්
ලොව බබලන මිණි කැට සේ ඒ දිවි දිදුලන්

තිළිණ: වැඩ නිම නොකරනා බවට දොස් අහගන්නේ
පොත් පත් පාඩම් වැඩ මට නැත ප්‍රිය වන්නේ

සීයා: කළට වෙලාවට පාඩම් නිම කරලන්නේ
එ ලෙස කරන දරුවන් ඉදිරියට ම යන්නේ

ළමුන් තිදෙනා:
සීයා කියූ යහ ඔවදන් ගරු කරලන්නේ
ගුණ දහමින් පිරි දරුවන් ලෙස දිදුලන්නේ

**ගෙදර පරිසරයෙන්**

සැම කටයුත්තක් ම සාර්ථක ව නිම කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 2:0** **:** ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.2.6 :** ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනයේ බලාපොරොත්තුව තුළ දිවි ගෙවයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ කරුණු රැස් කරයි.
- ජේසුස් වහන්සේ නැවත නැගිටි බව පිළිගනියි.
- පුනරුජ්ජීවනය පිළිබඳ නිර්මාණාත්මක ලිපියක් රචනා කරයි.
- උත්ථාන වූ ජේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ ලෙස විශ්වාස කරයි.
- පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ පිළිබඳ සුභාරංචිය අන් අය සමග බෙදා ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ගීතිකාවේ පිටපත් සිසුන් අතට පත් කොට සිසුන් සමග එක්ව ගීතිකාව ගායනා කරන්න. (ඇමුණුම 2)
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ජේසුස් වහන්සේගේ හිස්වූ සොහොන පමණක් හමුවීම.
  - ජේසුස් වහන්සේ මරණය පරදා නැවත නැගිටි බව
  - පුනරුජ්ජීවනයට භාවිත වන වෙනත් වදන් (උත්ථානය, නැවත නැගිටීම)
  - පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ අප ජීවිත තුළ වැඩ වසන බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන්ට ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ජේසුස් වහන්සේ මරණයට පත් වී තෙ දිනකින් නැවත නැගිටි බව.
  - ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ කළ තෝමස් ඒ අතරෙහි නො සිටීම.(ශු. ජොහාන් 20:24)
  - නැවත නැගිටි ජේසුස් වහන්සේ දුටු බව ශ්‍රාවකයන් කී විට තෝමස් එය අ විශ්වාස කිරීම (ශු. ජොහාන් 20:25)
  - ජේසුස් වහන්සේ තෝමස්ට දර්ශනය වීම. (ශු. ජොහාන් 20:26-27)
  - තෝමස් පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ 'දෙවියන් හා ස්වාමින්' ලෙස විශ්වාස කිරීම. (ශු. ජොහාන් 20:28-29)
  - පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ අප ජීවිත තුළට නව බලාපොරොත්තුවක් ගෙන එන අයුරු.
  - පුනරුජ්ජීවනයේ බලාපොරොත්තුව තුළ දිවි ගෙවීම.

- නිරතුරුව ම ජේසුස් වහන්සේ විශ්වාස කිරීම
- පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ අන් අයට හඳුන්වා දීමේ වැදගත්කම

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය ශු. ජොහාන් 20:24-29
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1,
ඇමුණුම 2 හි පිටපත්

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ශු. ජොහාන් 20:24-29 දක්වා කොටස කියවන්න
- ඒ පිළිබඳ ව මෙනෙහි කරන්න
- එම තොරතුරු අලළා ඔබ 'පුනරුජ්ජීවනය වූ ජේසුස් වහන්සේ අත්දුටු තෝමස්' යැයි සිතා ඔබේ මිතුරෙකුට ලිපියක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ඇමුණුම 2**

(ලේ කිරි කරලා තාලයට අනුව . . . .)

හිම්දිරි උදයේ
සමිඳුන් සෙවුයේ
හිස්වූ සොහොනක් පමණයි
හිමි හමු නොවුයේ

මරණය පරදා
ජයගත් සමිඳා
පැසසුම් පුද දෙමින් වඳිමු
සිහිකර නිබඳා

රුදුරු මරණයේ
බලය සුන් කළේ
නැවත නැගිටි සමිඳු සදා
දිවිය හිමි කළේ

ජීවය ලබමින්
සාමය වඩමින්
නැවත නැගිටි සමිඳු සොයමු
අප තුළ අදරින්

**ගෙදර පරිසරයෙන්**

සැම විට ම ජේසුස් වහන්සේ තම ස්වාමින් වහන්සේ ලෙස විශ්වාසයෙන් පිළිගැනීමට මඟ පෙන්වන්න.

**නිපුණතාව 3:0 :** ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 7.3.1 :** පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය පිළිබඳ ව සවිස්තරාත්මක හැදෑරීමකට යොමු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- පෙන්තකොස්ත දින සිදුවීම් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ වැඩ වසන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙ යි.
- ශුද්ධාත්ම මග පෙන්වීම පතා යාච්ඤා කරයි.
- ශුදධාත්මයාණෝ ජීවිතයට වැඩම කිරීමෙන් ලබන ජීවිත නවෝදය පිළිබඳ ව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය පිළිබඳ ව චිත්‍රයක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- බයිබල් පාඨය සිසුන් කිහිප දෙනකු ලවා හඬගා කියවීමට අවස්ථාව සලසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - පෙන්තකොස්ත දින අපෝස්තුළුවරු ඇතුළු කණ්ඩායම එකට රැස්ව සිටීම.
    - ශුද්ධාත්ම ආගමනය එදින සිදු වීම.
    - එම කණ්ඩායම අන්‍ය භාෂා වලින් කථා කළ බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - ජුදෙව් පෙන්තකොස්ත මංගල්‍ය දින බොහෝ දෙනා ජෙරුසලමට පැමිණ සිටි බව. (ක්‍රියා 2: 5)
    - ජේසුස් වහන්සේගේ ගෝලයන් ඇතුළු කණ්ඩායම ද එදින එකට රැස්ව සිටීම. (ක්‍රියා 2: 1)
    - සැඩ සුළඟක හඬත් සමග, ගිනිදළු වැනි වූ දිව්, අපෝස්තුළු ඇතුළු කණ්ඩායම මත පිහිටුවනු ලැබීම. (ක්‍රියා 2: 3)
    - අපෝස්තුළුවරුන් ඇතුළු සියලු ම දෙනා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම. (ක්‍රියා 2: 4)

- අන්‍ය භාෂා වලින් කථා කිරම. (ක්‍රියා 2: 11)

- විවිධ රට වලින් පැමිණි, විවිධ භාෂාවන් කථා කරන ජුදෙව්වන්ට තමන්ගේ ම භාෂා වලින් එය පැහැදිලි වීම. (ක්‍රියා 2: 7)

- අපෝස්තුළුවරු ඇතුළු කණ්ඩායම ජීවිත නවෝදයක් අත් දැකීම.

- ශුද්ධාත්ම මග පෙන්වීම පතා යාච්ඤා කළ යුතු බව.

- ශුද්ධාත්මයාණන් වහන්සේ ඉතා බලවත් ලෙස අපගේ ජීවිත තුළ ද ක්‍රියා කරන බව.

(මිනිත්තු 45)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය ක්‍රියා 2: 1-13 .
- ශුද්ධාත්ම ආගමනය පිළිබිඹු වන චිත්‍රයක්
- ඒ 4 කඩදාසි, බ්‍රිස්ටල් බෝඩ්, පාට වර්ග,ගම්, කතුරු, පෑන් පැන්සල්
- ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

.

1 කණ්ඩායම :-

- ක්‍රියා 2: 1-13 අවබෝධයෙන් යුතු ව කියවන්න.

- එහි සිදුවීම් ඇතුළත් කොට චිත්‍ර කතාවක් නිර්මාණය කරන්න.

2 කණ්ඩායම :-

- ක්‍රියා 2: 1-13 අවබෝධයෙන් යුතු ව කියවන්න.

"ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ගෝලයින්ගේ අත්දැකීම"
යන මැයින් පුවත් පතකට ලිපියක් නිර්මාණය කරන්න.

**ගෙදර පරිසරයෙන්**

ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම් සොයමින්, කටයුතු කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත් දකියි.

**නිපුණතා මට්ටම 7:3:2** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සවිමත් වූ මුල් කිතුනු සභාවෙන් ආදර්ශයක් ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ පිළිවෙළින් ගොනු කරයි.
- ශුද්ධාත්මයාණන් වහන්සේ සභාව තුළ ක්‍රියාකරන බව පිළිගනියි.
- මුල් සභාවේ ලක්ෂණ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තමා සතු දේ අන්‍යයන් සමග බෙදා ගනියි.
- එකමුතුව ගෘහ යාච්ඤා රැස්වීම් වලට සහභාගි වෙයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- දේවස්ථානයක ඇතුලත පෙන්වන චිත්‍රයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- A4 කඩදාසි කිහිපයක් සිසුන්ට ලබා දෙන්න.
- දේවස්ථානයේ කෙරෙන කාර්යයන් හා සේවාවන් පිළිබඳව කරුණු දෙක බැගින් ලියන්නට මග පෙන්වන්න.
- එසේ ලියූ දේ දේවස්ථාන චිත්‍රයේ සවි කරන්නට උපදෙස් දෙන්න.
- සිසුන් ලියූ දේ පවසන්නට ඉඩ සලසන්න.
- එම කරුණු යොදා ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - දේවස්ථානය යනු කිතුනුවන් නමස්කාරය සඳහා යොදා ගන්නා ස්ථානය බව
    - එහි දී දේව වචනය අධ්‍යයනය කළ හැකි බව.
    - බෞතීස්මය සහ ශුද්ධ සහභාගිකමේ පිළිවෙත එහි පවත්වන බව.
    - දේවස්ථානයේ විවිධ සමිති සමාගම් පවත්වන බව.

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් අතට ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - පේදුරු තුමාගේ දේශනයෙන් ජනතාව තුළ සිත් හැරීමක් ඇති වීම. (ක්‍රියා 2: 37)
    - එදින 3000 ක් පමණ සෙනග බෞතීස්ම ලැබීම. (ක්‍රියා 2: 41)

- ඉගැන්වීම්, සහභාගිකම, රොටි කැඩීම හා යාච්ඤාව මුල් කිතුනු සභාවේ ලක්ෂණ බව ( ක්‍රියා 2: 42)

- ශුද්ධාත්ම බලයෙන් බොහෝ අරුම පුදුම දේ හා ලකුණු සිදු කල බව. (ක්‍රියා 2: 43)

- දේපල විකුණා එකිනෙකා රැක බලා ගැනීම. (ක්‍රියා 2: 45)

- දේව ප්‍රශංසාව පුදමින් සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ජීවත්වීම. (ක්‍රියා 2: 47)

- මුල් ක්‍රිස්තියානි සභාවේ වර්ධනය දවස්පතා සිදුවිය. (ක්‍රියා 2: 47)

- එකමුතු වී යාච්ඤා කළ යුතු බව.

- නිරතුරුව ම දේව වචනය කියවීමට යොමු විය යුතු බව.

- අප සතු දේ අන්‍යයන් සමඟ බෙදා ගත යුතු බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය ක්‍රියා 2: 37-47
දෙවි මැදුරක ඇතුලත දර්ශනය සහිත පින්තූරයක්.
ඒ4 කඩදාසි
පෑන්, පැන්සල්, ඩ්‍රොයින් පින්, ගම්
ඇමුණුම I

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

.

ක්‍රියා 2: 37-47 පාඨය අවබෝධයෙන් යුතුව කියවන්න.

1. මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ හඳුනා ගනිමින්, එය නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න.

2. වත්මන් සභාවන් වල දක්නට ලැබෙන ලක්ෂණ පෙළ ගස්වන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

තම සභාව උදෙසා දිනපතා යාච්ඤා කරන්නට යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත් දකියි.

**නිපුණතා මට්ටම 7.3.3 :** ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් නිරතුරුවම තම ජීවිතය උද්දීපනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- කොර වූ මිනිසා ලැබූ සුවය පිළිබඳ සිද්ධියට අදාළ කරුණු ගොනු කරයි.
- දෙවියන් වහන්සේ මිනිසාට සුවය ලබා දෙන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙ යි.
- සුවය ලැබීමට ඇදහිල්ලෙන් යාච්ඤා කරයි.
- ජීවිතයට දිරියක් හා නවෝදයක් ගෙනෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ බව ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- ජේසුස් වහන්සේ විසින් සුවය දෙන ලද රෝගීන් දෙදෙනා බැගින් හුණු පුවරුව මත ලියන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - විවිධ රෝගීන් ජේසුස් වහන්සේගෙන් සුවය ලද බව.
    - ජේසුස් වහන්සේගේ ගෝලයන් ද ශුද්ධාත්ම බලයෙන් සුව කිරීම්වලට දායක වූ බව.
    - සුවය ලැබූ අය දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ බව.
    - අපට ද දෙවියන් වහන්සේ සුවය ලබා දෙන බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.

ක්‍රියා 3: 1-10

- පේදුරු තුමා සහ ජොහාන් තුමා නිරතුරුව යාච්ඤාව සඳහා ජෙරුසලම් දේව මාලිගාවට ගිය බව.
- සිඟමන් ඉල්ලන මිනිසුන් "සුදර්ශන" නම් වූ දොරටුව ලඟ සිටීම.
- උපතේ පටන් කොරවූ මිනිසකු පේදුරු හා ජොහාන් තුමාගෙන් සිඟමන් යැදීම.

- ජේසුස් වහන්සේගේ නාමයෙන් කොර මිනිසාට සුවය ලබාදීම.

- කොර මිනිසා විශ්වාසයෙන් සුවය ලැබීම.

- සුවය දුන් දෙවියන්වහන්සේට ප්‍රීතියෙන් ප්‍රශංසා කිරීම.

- ශුද්ධාත්ම බලයෙන් හා ඇදහිල්ලෙන් මිනිස් ජීවිතවලට නවෝදයක් ලැබීම.

- ක්‍රිස්තු අනුගාමිකයන් නිරතුරුවම ශුද්ධාත්ම දිරිය හා සවිය ලැබිය යුතු බව.

- දෙවියන් වහන්සේ අපට ද සුවය දානය කරන බව.

- දෙවියන් වහන්සේ අපගේ යාච්ඤා වලට පිළිතුරු දෙන බව.

(මිනිත්තු 45)

**ගුණාත්මක යෙදවුම්** :
- ශුද්ධ බයිබලය ක්‍රියා 3: 1-10
- ඒ 4 කොළ
- පෑන්, පන්සල් වර්ග
- නාට්‍ය නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

.

1. කණ්ඩායම
- ක්‍රියා 3: 1-10 දක්වා කියවන්න.
- එම පාඨයේ සඳහන් විවිධ චරිත හඳුනා ගන්න
- එම සිද්ධියට අදාළ අවස්ථාවන් අධ්‍යයනය කරන්න.
- එම සිදුවීම නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම
- ක්‍රියා 3: 1-10 දක්වා කියවන්න.
- එහි සඳහන් සිද්ධිය අධ්‍යයනය කරන්න.
- සුවය ලැබූ මිනිසා ඔබ යයි සිතා, එම අත්දැකීම ආත්ම ප්‍රකාශනයක් ඇසුරින් ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්නට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

.

රෝගීන් බැහැ දකිමින්, ඔවුන් උදෙසා යාච්ඤා කරන්නට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි

**නිපුණතා මට්ටම 7.4.1 :** කන්ද උඩ දේශනාවේ ඉගැන්වීම් තම ජීවිතයට පන්නරයක් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 03

**ඉගෙනුම් පල**

- කන්ද උඩ දේශනාවේ ඉගැන්වීම් පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- සතුරාට ද ප්‍රේම කළ යුතු බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- සැමටම දේව කරුණාව හිමි වන බව විශ්වාස කරයි.
- එකමුතු ව පියාණන් වහන්සේට යාච්ඤා කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - සතුරාට ප්‍රේම කළ යුතු බව.
    - පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීම.
    - දේව කරුණාව සැමට ම හිමි වන බව.
    - අන් අයට පෙනෙන පිණිස යාච්ඤා නොකළ යුතු බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - සතුරාට ප්‍රේම කිරීම හා පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීමෙන් දේව පුත්‍රභාවය හිමි වන බව. (ශු. මතෙව් 5:45)
    - යාච්ඤාවට යොමු විය යුතු ආකාරය. (ශු. මතෙව් 6:5-9)
    - අප ඉල්ලන්නටත් පෙර අපගේ උවමනාවන් උන්වහන්සේ දන්නා බව. (ශු. මතෙව් 6:8)
    - ස්වාමින්ගේ යාච්ඤාව තුළ, අපගේ දවස්පතා ආහාරය, අපගේ වරදට කමාව, පරීක්ෂාවට නො පමුණුවන ලෙස ඉල්ලීම් ඇති බව.(ශු.මතෙව්6:9-13)
    - දේව වචනය අසා එය පිළිපැදිය යුතු වීම. (ශු. මතෙව් 7:24)
    - දේව වචනය තුළින් අපගේ ජීවිත සවිමත් වන බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. මතෙව් 5:43-48, 6:5-15, 7:24-28
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
බ්‍රිස්ටල් බෝර්ඩ්
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ශු. මතෙව් 5:43 සිට 48 දක්වා බයිබල් කොටස කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
"සතුරාට ප්‍රේම කරමු. පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරමු." යන මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් ලියන්න.

2 කණ්ඩායම

ශු. මතෙව් 6:5 සිට 15 දක්වා බයිබල් කොටස කියවන්න.
එම කරුණු පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.
ඔබ යාච්ඤා කරන කළ පිළිපැදිය යුතු කරුණු හා ස්වාමින් වහන්සේගේ යාච්ඤාව ඇතුළත් කරමින් නිර්මාණාත්මක බිත්ති රඳවනයක් සකසන්න.

3 කණ්ඩායම

ශු. මතෙව් 7:24 සිට 27 දක්වා බයිබල් කොටස කියවන්න.
එම කරුණු පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.
"දෙව් වදන් පිළිපැද දෙවිඳුන් තුළ සවිමත් වෙමු." යන මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් ලියන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

1 ඔබේ සතුරා හට ප්‍රේම කරන්නට - පීඩා කරනුන් උදෙසා යදින්නට
හැකි නම් ඔබ හට එසේ කරන්නට - හිමිවේ සග ලොව දරුවන් වන්නට

2. දුදනන් හා සුදනන් යන සැම හට - හිරු පායයි, වැසි සලසයි එක ලෙස
එලෙසට මිතුරට මෙන් සතුරා හට - ප්‍රේම කරන්නට යොමු වනු සැමවිට

3. ආචාරය සොයුරට පමණක් නම් - විශේෂ නොවේය ඔබගේ ක්‍රියාව
සැම හට එක ලෙස ප්‍රේම කරයි නම් - විශේෂිත ය ඔබගේ එම ක්‍රියාව

**ගෙදර පරිසරයෙන්**

වැරදි කරන අය උදෙසා යාච්ඤා කිරීමට යොමු කරවන්න

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි

**නිපුණතා මට්ටම 7.4.2 :** යහ පැවැත්මෙන් යුතු සමාජයක් ගොඩ නැගීම සඳහා තම හැකියාවන් දායක කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- යහපත් සමාජයක් ගොඩ නැගීමට තම හැකියා දායක කර ගත හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.
- අප ලද හැකියාවන් දේව ගෞරවය උදෙසා ක්‍රියාවට නැංවිය යුතු බව පිළිගනියි.
- නාට්‍යයක් ඉදිරිපත් කරයි.
- තම හැකියාවන් වර්ධනය කර ගනියි.
- නොමග ගිය අයට නිසි මග පෙන්වීමට ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් අතට ඒ 4 කඩදාසිය බැගින් ලැබෙන්නට සලස්වන්න.
- තමා තුළ ඇති විශේෂ හැකියාවන් 2 බැගින් ලියා හුණු පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - එක් එක් අයට දෙවියන් වහන්සේ ලබා දුන් විශේෂ හැකියාවන් ඇති බව.
    - එම හැකියාවන් මතුකර වර්ධනය කර ගනිමින් ක්‍රියාවට නැංවිය යුතු බව.
    - තම හැකියා තුළින් දෙවියන් වහන්සේට සේවය කළ යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - දෙවියන් වහන්සේ අපට විවිධ හැකියාවන් දී තිබීම.
    - අප ලද සියලු හැකියා වර්ධනය කර ගත යුතු බව.
    - නො සඟවා තම හැකියා දේව ගෞරවය උදෙසා යොදා ගැනීම. (ශු. ලූක් 19:20)
    - තම හැකියා වර්ධනය කර ගනිමින් ක්‍රියා කරන විට තව තවත් දේව ආශිර්වාද ලැබෙන බව.

- නො මග ගිය අය යහ මගට ගැනීම. (ශු. ලූක් 15:2-6)

- පසුතැවී සිත් හරවා ගන්නා එක් පව්කාරයකු ගැන ස්වර්ගයේ ප්‍රීතිය ඇතිවීම. (ශු. ලූක් 15:7)

- යහ පැවැත්මෙන් යුතු සමාජයක් ගොඩ නැගීම සඳහා තම හැකියා දායක කර ගැනීම.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. ලූක් 15:1-7, 19:11-27
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

.

1 කණ්ඩායම

ශු. ලූක් 19:11-27 දක්වා බයිබල් කොටස කියවන්න.

එම කරුණු පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.

"රන් කාසි දසය පිළිබඳ උපමා කතාව." නාට්‍යයකින් ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම

ශු. මතෙව් 15:1-7 දක්වා බයිබල් කොටස කියවන්න.

එම කරුණු පිළිබඳව සාකච්ඡාවක් මෙහෙය වන්න.

නැතිවු බැටළුවා පිළිබඳ උපමා කතාව ඇසුරින් නාට්‍යයක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

තම හැකියාවන් අන් අයගේ යහපත සඳහා යෙදවීමට යොමු කරවන්න.

**නිපුණතාව 4.0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි

**නිපුණතා මට්ටම 7.4.3 :** ජේසුස් වහන්සේ අනුගමනය කරමින් ක්‍රියාකාරි සේවයේ නියැලෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ජේසුස් වහන්සේ සැම හට සැම විට කළ සේවය පිළිබඳ කරුණු ගොනු කරයි
- සැම හට සැම විට සේවය කළ යුතු බව පිළි ගනියි.
- නාට්‍යය පිටපත් රචනා කරයි.
- සැම දෙනා පිළි ගනියි.
- සාක්ෂි දරමින් එකමුතුව සේවය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පෙර පුහුණුවකින් යුතුව ඇමුණුම 2 පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - අශිර්වාද කරගැනීම පිණිස ළදරුවන් ජේසුස් වහන්සේ වෙත රැගෙන ආ බව.
    - ගෝල පිරිස එය වැලැක්වීමට ක්‍රියා කිරිම.
    - ජේසුස් වහන්සේ, ළදරුවන්ට ආශිර්වාද කිරිම.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන්ට ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - ජේසුස් වහන්සේ ගෝලයන්ගේ ප්‍රතික්ෂේපය නොතකා දරුවන්ට ආශිර්වාද කිරිම.
    - ජේසුස් වහන්සේ දරුවන් අගය කිරිම.(ශු. මාර්ක් 10:14)
    - සාමාරියන් හා යුදෙව්වන් අතර සම්බන්ධතාවයක් නො තිබුණු බව.
    - ජේසුස් වහන්සේ සාමාරියේ ස්ත්‍රියගෙන් වතුර ඉල්ලූ බව (ශු යොහාන් 4:28)
    - ජේසුස් වහන්සේ තමා මෙසියස් වහන්සේ බව ප්‍රකාශ කිරීම.
    - ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ බව හඳුනාගත් සමාරියේ ස්ත්‍රිය ඒ පිළිබඳ ව නොබිය ව සාක්ෂි දැරිම. (ශු. ජොහාන් 4:39)
    - අප ද ජේසුස් වහන්සේ පිලිබඳ සාක්ෂි දැරීමට යොමුවිය යුතු බව.

- අප ජේසුස් වහන්සේ අනුගමනය කරමින් ක්‍රියාකාරි සේවයක නියැලිය හැකි ආකාරය.
- සෑම හට සෑම විට සේවය කිරීමට යොමුවිය යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ශු. මර්ක් 10:13-16, ශු. ජොහාන් 4:7-10, 25-30, 39
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

ශු. ජොහාන් 4:7-10. 25-30, 39 දක්වා බයිබල් කොටස කියවන්න.

එම බයිබල් කොටස ආදාල කර ගනිමින් නාට්‍යය පිටපතක් රචනා කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරිමට සුදානම් වන්න.

## ඇමුණුම 2

කාන්තාවක්:- අන්න අන්න ජේසුස් වහන්සේ මේ පැත්තට වඩිනවා. අපි ඉක්මනින් අපේ දරුවන් රැගෙන යමු.

තවත් කාන්තාවක්:- යමු යමු අපේ දරුවන් ආශිර්වාද කර ගන්න. උන්වහන්සේ ලඟට යමු.

ශ්‍රාවකයෙක්:- (තරවටු කරමින්) දැන් උන්වහන්සේට කරදර කරන්න එපා. මෙතනින් ඉවත් වෙන්න.

කාන්තාවක්:- අනේ අපේ දරුවන්ට ආශිර්වාද කර ගන්න පමණයි. අපි යන්නේ.

ශ්‍රාවකයෙක්:- අපි දැන් කිව්වනේ ඔය ළමයි ගෙනල්ලා උන්වහන්සේට කරදර කරන්න එපා කියලා.

ජේසුස් වහන්සඃ- ළදරුවන් මා වෙත එන්න ඉඩ දෙන්න ඔවුන් වළක්වන්න එපා. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මේ පුංචි දරුවන්ගේ

කාන්තාවඃ- අන්න උන්වහන්සේ දරුවන්ට කතා කරනවා. පුතාලා ඉක්මනින් උන්වහන්සේ ලඟට යන්න.

ජේසුස් වහන්සේඃ- (දරුවන් තුරුලට ගෙන) සැබවින්ම මම ඔබට කියමි. යම් කෙනෙකු දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළදරුවකු සේ පිළි නොගත්තොත් ඔහු කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නේය.

**ගෙදර පරිසරයෙන්**

සැම විට සැම හට සේවය කිරිමට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි

**නිපුණතා මට්ටම 7.4.4** : දේව රාජ්‍යයේ අනන්‍යතාවය සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**කාලච්ජේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- සමාජ අවශ්‍යතාවල දී එක්ව ක්‍රියා කළ හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.
- භේද නොතකා උපකාර කළ යුතු බව පිළිගනියි.
- ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- තමා සතු දේ බෙදා ගැනීමට යොමු වෙයි.
- සමාජයේ අවශ්‍යතා වලදී උපකාර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ව්‍යසන අවස්ථාවන් පිළිබඳ සඳහන් වන පුවත් පත් ශීර්ෂ පාඨ හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- පුවත් ශීර්ෂ පාඨ ඇසුරෙන් පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - විවිධ ව්‍යසන නිසා මිනිසුන් පීඩා විඳින බව.
  - පීඩාවන්ට ලක්වුවන්ට උපකාර කළ හැකි ආකාරය.
  - විපතකදී භේද නොතකා ක්‍රියා කිරීම.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන්ට ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ක්ලෝඩියස් රජුගේ කාලයේ ලොව පුරා සාගතයක් පැවති බව
  - ජේසුස් වහන්සේගේ ගෝල පිරිස සාගතයේ දී තම තමාගේ වත්කමේ හැටියට උපකාර කළ බව.
  - ආධාර එකතු කර සභා මුලිකයන්ට යවා ජුදෙව්වන්ට සහය වු බව
  - භේද නො තකා ක්‍රියා කළ යුතු බව
    (ස්ත්‍රී පුරුෂ, දාස නිර්දාස, ජාති බේද , ආගමික බේද, උගත් නූගත් දුප්පත් පොහොසත් ආදී,)
  - බේද නො තකා සමාජ අවශ්‍යතාවල දී එක්ව ක්‍රියා කිරීම
  - අපගේ පුළුවන්කමේ හැටියට එකිනෙකාගේ අවශ්‍යයතාවල දී උපකාර කළ යුතු බව
  - සාමයෙන් හා සහජීවනයෙන් කටයුතු කිරිම.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ගලාති 3:28, ක්‍රියා 11:27-30
වාසන අවස්ථාවනට මුහුණ දීම පිළිබඳ පුවත්පත් ශීර්ෂ පාඨ
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

.

ගලාති 3:28, ක්‍රියා 11:27-30 කියවන්න.

ඒ සාකච්ඡාවක් මෙහෙය වන්න.

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් කරුණු ගොනු කරන්න.

- බයිබල් කොටසට අදාළ ව සමාජ අවශ්‍යතා වලදී ක්‍රියා කළ යුතු අයුරු ලියා දක්වන්න.
- විවිධ සමාජ අවශ්‍යතාවයන් නම් කරන්න.
- බේද නොතකා සමාජ අවශතාවලදී එක්ව ක්‍රියා කළ හැකි ආකාරය ලියා දක්වන්න.

**ගෙදර පරිසරයෙන්**

හදිසි අපදාවල දී හැකි අයුරින් උපකාර කිරිමට යොමු කරන්න.

**නිපුණතාව 7:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 7:5:1** : ශුද්ධ බයිබලය ලේඛන ගත වීමේ මූලාරම්භය පිළිබඳ කරුණු සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල**

- ශුද්ධ බයිබලය ලේඛන ගත වීම පිළිබඳ කරුණු ගොනු කරයි.
- ශුද්ධ බයිබලය ලියවුනේ දෙවියන්වහන්සේගේ අනුහසින් බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරයි.
- එකමුතුව දේව වචනය මෙනෙහි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- බයිබලය ලියැවුණු පැරණි මූලාශ්‍ර කිහිපයක ඡායාරූප පන්තියට ඉදිරිපත් කරන්න. ( ගල් පුවරු, මැටි, පැපිරස් පත් )
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ශුද්ධ බයිබලය ලේඛන ගත කිරීමට පෙර විවිධ මූලාශ්‍ර පැවති බව. (ගල් පුවරු, මැටි, පැපිරස් පත්)
  - කිතුනු අපගේ ශුද්ධ ලියවිල්ල බයිබලය බව.
  - ශුද්ධ බයිබලය දේව අනුහසින් ලියැවුණ බව.
  - මිනිස් කතුවරුන් විසින් රචනා කළ බව.
  - වාචික ව පැවති දේව වචනය පසුව ලේඛන ගත වූ බව
  - දේව වචනය මෙනෙහි කළ යුතු බව

(මිනිත්තු 5)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ශුද්ධ බයිබලය දේව අනුහසින් ලියැවී ඇති බව.
  - ලේඛන ගත කිරීමට පෙර විවිධ මූලාශ්‍ර
  - ශුද්ධ බයිබලය ලේඛන ගත කිරීමේ අවශ්‍යතාවයක්
  - වාචිකව පැවති දේව අනාවරණය ලේඛන ගත විය යුතු බව

(මිනිත්තු 10)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය (නව පිටපතක්)
ශුද්ධ බයිබලය ලියවුනු මූලාශ්‍ර කිහිපයක පින්තූර
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
පාට පැන්සල්
බ්‍රිස්ටල් බෝඩ්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

1 වන කණ්ඩායම:

ශුද්ධ බයිබලයේ සැකැස්ම රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න

2 වන කණ්ඩායම

පෙළ පොත කියවා ශුද්ධ බයිබලය ලේඛන ගත වීම පිළිබඳ ව පෝස්ටරයක් නිර්මාණය කරන්න.
තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ශුද්ධ බයිබලය දිනපතා කියවීමට හුරු කරවන්න.

**නිපුණතාව 7:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.5.2** : මේරි ජෝන්ස් හා තෝමස් චාල්ස් ශුද්ධ බයිබලයේ ව්‍යාප්තිය සඳහා ප්‍රයත්න දැරූ ආකාරය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ශුද්ධ බයිබලයේ ව්‍යාප්තිය පිළිබඳ කරුණු ගොනු කරයි.
- දේව වචනයෙන් පෝෂණය ලැබිය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි.
- ශුද්ධ බයිබලය තම ජීවිතයට අත්වැලක් කර ගනියි.
- දේව වචනය ව්‍යාප්තිය සඳහා සාමූහික ව දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

ඇමුණුම 2 පන්තියට ඉදිරිපත් කරන්න.

පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.

- මේරි ජෝන්ස් ට ශුද්ධ බයිබලය හිමි කර ගැනීමේ ආශාවක් තිබූ බව.
- ඇය ඒ සඳහා බොහෝ වෙහෙස වී කටයුතු කළ බව.
- තෝමස් චාල්ස් මහතා ශුද්ධ වූ බයිබලය පිටපත් කිරීමේ ප්‍රයත්නය දියත් කළ ආකාරය

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - මේරි ජෝන්ස් ශුද්ධ බයිබලයක් හිමි කර ගැනීමේ අරමුණ ඉටු කර ගත් ආකාරය.
    - ශුද්ධ බයිබලය මුද්‍රණ කටයුතු තෝමස් චාල්ස් තුමාගේ මූලිකත්වයෙන් ඇරඹීම.
    - විලියම් කේරි තුමා මුද්‍රණ කටයුතු සඳහා දායක වීම.
    - ලොව පුරා ශුද්ධ බයිබලය ව්‍යාප්ත කිරීමට බයිබල් සමාගම ක්‍රියා කරන බව.
    - බයිබල් සමාගම ලොව පුරා ඉටු කරන සේවාවන්
    - පෞද්ගලික පරිහරණය සඳහා බයිබල් පිටපතක් තබා ගැනීමේ වැදගත්කම.
    - ශුද්ධ බයිබලය අපගේ ජීවිතයට අත්වැලක් බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය (නව පිටපතක්)
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
පාට පැන්සල්
බ්‍රිස්ටල් බෝඩ්
ගම්
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

1 වන කණ්ඩායමඃ

පෙළ පොත කියවා බයිබල් සමාගමේ සේවය පිළිබඳ කරුණු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

2 වන කණ්ඩායම

පෙළ පොත කියවා මේරි ජෝන්ස්, තෝමස් චාල්ස් තුමා, විලියම් කේරි තුමා යන අයගේ ජීවන තොරතුරු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

**මේරි ජෝන්ස්**

1. එක් දහස් හත්සිය අසූ හතරේ
උතුරු වේල්සයේ උපත ලැබූ
මේරි ජෝන්ස් නම් දැරියකි සිවුමැලි
දිරියෙන් හා සවියෙන් පිරුණු

2. කතා වලට බයිබලයේ සඳහන්
සවන් දීමට යි ඇය පුරුදු
හිමි කර ගන්නට බයිබලයක් ඇය
තදින් ම ආශාවෙන් පෙළුණු

3. විශාල මුදලක් අවශ්‍ය වූයේ
හිමි කර ගැනුමට බයිබලයක්
කෙසේ ද මම ඒ මුදල් සොයන්නේ
සිතමින් ළතවුණි ඇය මොහොතක්

4. කුමන ලෙසින් හෝ මුදල් සොයන්නෙමි
යන අදිටන ඇය තුළ තිබුණා
හය වසරක් තුළ මුදල් සොයන්නට
නොයෙකුත් වැඩ වල ඇය යෙදුණා

5. මී මැසි පාලන මේස් මැසීම ද
බිත්තර දර විකුණනු ලැබුවා
ගොවිපළේ වැඩ කොට අසරණ වැඩිහිටි
පිරිසට ඇය නිති පිහිට වුණා

6. වසර හයක කාලයක් ගෙවෙද් දී
මුදල් සියල්ල ද එකතු වුණා
එම මුදලින් බයිබලයක් ගන්නට
කඳුකර පෙදෙසට පා නැගුවා

7. තෝමස් චාල්ස් මැතිඳුන් හමු වීලා
බයිබලයක් ගන්නට යන්නේ
බයිබල් පිටපත් විකිණී ඇති බව
මේරි ජෝන්ස් හට පවසන්නේ

8. සියළු පැතුම් සුන් වී යාමෙන් ඇගේ
නෙත් කඳුලින් දැන් තෙත් වන්නේ
ඒ දුටු තෝමස් මැතිඳුගෙ හදවත
සෝ සුසුමින් පිරී ඉතිරෙන්නේ

9. වෙනත් අයකු හට විකුණනු ලැබ ඇති
බයිබලයක් ඇය හට දෙන්නේ
පැතු පැතුම් ඉටු වීමෙන් සතුටින්
ඇය තම නිවසට පිය මැන්නේ

10. බ්‍රිතාන්‍යයේ බයිබල් සමාගම
ඇරඹීමයි ඉන් සිදු වන්නේ
එය ඇරඹීමට මේරි ජෝන්ස්ගේ
මේ සිදු වීමයි මුල් වන්නේ

**ගෙදර පරිසරයෙන**

ශුද්ධ බයිබලය දිනපතා කියවීමට හුරු කරවන්න.

**නිපුණතාව 7:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.5.3** : ශුද්ධ බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්තනය වීම පිළිබඳ තොරතුරු හදාරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ශුද්ධ බයිබලය පරිවර්තනය වී ඇති විවිධ භාෂාවන් ගැන තොරතුරු රැස් කරයි.
- විවිධ භාෂාවන්ට පරිවර්ථනය වීම නිසා ශුද්ධ බයිබලය පහසුවෙන් තේරුම් ගත හැකි බව පිළිගනියි.
- පොත් පිංචක් නිර්මාණය කරයි.
- දිනපතා ශුද්ධ බයිබලය කියවයි.
- එකමුතුව ශුද්ධ බයිබලය අධ්‍යයනය කරයි. .

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- විවිධ භාෂාවන්ගෙන් ලිය වුණ බයිබල් පිටපත් හෝ ඡායාරූප සිසුන්ට ඉදිරිපත් කරන්න. (හෙබ්‍රෙව්/ග්‍රීක්/ලතින්/සිංහල/දෙමළ)
- සිසුන්ට එම පිටපත් හා ඡායාරූප තම දෑතට ගෙන නිරීක්ෂණ කිරීමට අවස්ථාව දෙන්න.
- වත්මන් සමාජයේ භාවිතා වන විවිධ භාෂාවන් පිළිබඳ සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - විවිධ භාෂාවන්ට ශුද්ධ බයිබලය පරිවර්තනය වී ඇති බව
    - විවිධ ලේඛකයන් එයට දායක වී ඇති ආකාරය.

(මිනිත්ත 15)

පියවර 2

- පන්තියේ සිසුන් අතට ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 35)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
    - ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුම මුලින්ම ලියවුණේ හෙබ්‍රෙව් භාෂාවෙන් බව.
    - නව ගිවිසුම ග්‍රීක් භාෂාවෙන් ලියවුණ බව.
    - විවිධ කතුවරුන්ගේ දායකත්වයෙන් විවිධ භාෂාවන් වලට පරිවර්ථනය වීම.
    - ශුද්ධ බයිබලය ලාංකේය භාෂාවන්ට පරිවර්ථනය වූ බව
    - ශුද්ධ බයිබලය විවිධ භාෂාවන්ගෙන් ලියවුනත් එහි අර්ථය හා අන්තර්ගත පණිවුඩය වෙනස් නොවන සේ පවතින බව.
    - ශුද්ධ බයිබලයේ විවිධ පරිවර්තනයන් අධ්‍යයන කළ යුතු බව.
    - ශුද්ධ බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්තනය හේතුවෙන් ලංකාව පුරා සුබසුන ව්‍යාප්ත වූ බව.
    - විවිධ පරිවර්තනයන් නිසා දෙවිඳුන් පිළිබඳ අවබෝධය වඩා පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : විවිධ භාෂාවන්ගෙන් ලියවුනු ශුද්ධ බයිබල් පිටපත් හෝ ඡායාරූප (හෙබ්‍රෙව්/ග්‍රීක්/ලතින්/සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
පාට පැන්සල්
බ්‍රිස්ටල් බෝඩ්
ගම්
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

ශුද්ධ බයිබලය පරිවර්තනය වූ විවිධ භාෂාවන් ගැන තොරතුරු සාකච්ඡා කරන්න.

එම සාකච්ඡා අනුව මෙතෙක් පවතින බයිබල් පරිවර්තන ගැන පොත් පිංචක් නිර්මාණය කරන්න

**ගෙදර පරිසරයෙන්**

.

ස්ව භාෂාවෙන් තමා කැමති ශුද්ධ ලියවිලි පාඨයන් කටපාඩම් කර ගැනීමට යොමු කරවන්න.

**නිපුණතාව 7.0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 7.5.4** : සෙසු ආගමික ලියවිලි පිලිබඳ අවබෝධයක් ලබමින් සහජීවනයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල**

- සෙසු ආගමික ලියවිලි ගැන ගැන තොරතුරු ගොනු කරයි.
- සෑම ආගමකට ම ඇති ආගමික ලියවිලි අගය කරයි.
- පෝස්ටරයක් නිර්මාණය කරයි.
- අන්‍ය ආගම්වලට ගරු කරයි.
- සෙසු ආගමිකයන් සමග සහජීවනයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස්**

පියවර 1

- සෙසු ආගමික ලියවිලිවල පින්තූර පංතියට ඉදිරිපත් කරන්න.
- එම ලියවිලි ගැන සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ත්‍රිපිටක ය බෞද්ධ ආගමික ලියවිල්ල බව.
  - ඉස්ලාම් ආගමිකයන් කුරාණය තම ශුද්ධ ලියවිල්ල ලෙස පිළිගන්නා බව.
  - හින්දු භක්තිකයන්ගේ ශුද්ධ ලියවිල්ල වේද ග්‍රන්ථ ය බව.
  - අන්‍ය ආගමිකයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම.
  - පාසලේ විවිධ ආගමික උත්සව වලට සහය දැක්වීම.

(මිනිත්ත 05)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - සෑම ආගමකටම ඊට අදාල ආගමික ලියවිලි ඇති බව.
  - සෑම ආගමකටම විශේෂ ආගමික සංකේතයක් හිමි බව.
  - සෑම ආගමකට අදාල උත්සව පවතින බව.

(මිනිත්තු 15)

**ගුණාත්මක යෙදවුම්** : සෙසු ආගමික ලියවිලිවල පින්තූර
ඒ 4 කඩදාසි
කතුරු
පෑන්
බ්‍රිස්ටල් බෝඩ්
ගම්
ඇමුණුම 1,

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

1 වන කණ්ඩායම

බෞද්ධයන්ගේ ආගමික ලියවිල්ල ඇසුරෙන් බෞද්ධ ආගමික ඉගැන්වීම් හා උත්සව පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

2 වන කණ්ඩායම

ඉස්ලාම් භක්තිකයන් පිළිගන්නා කුරානයේ ප්‍රධාන ඉගැන්වීම්, චාරිත්‍ර හා උත්සව ඇතුළත් වන සේ පෝස්ටරයක් ඉදිරිපත් කරන්න.

3 වන කණ්ඩායම

වේද ග්‍රන්ථ හා හින්දු භක්තිකයන්ගේ ඉගැන්වීම්, වත් පිළිවෙත් ඇතුළත් වන සේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

**ගෙදර පරිසරයෙන්**

.

සෑම ආගමකටම ගරු කිරීමට යොමු කරවන්න.

## විවිධ සහය

| | |
|---|---|
| පරිඝණක වදන් සැකසුම: | ෂර්වෝන් මෙන්ඩිස්<br>මංගලිකා විජේරත්න |
| කාර්යාලයීය කටයුතු : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>ඩයස් අමරසිංහ මහතා |